# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,562—1965 නොවැම්බර් 20 වැනි සෙනසුරාදා—1965.11.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### අංක 25/65 දරණ ආනයන පාලන දැන්වීම

වාහන ආනයනය කිරීම

තේ, රබර් හා පොල් වතු වලින් ද, නිපැදුම් කර්මාන්තායතනවලින් ද දෙලෙව් කිරීම හා බෙදාහැරීම් සේවාවලින් ද, තමන්ගේ ම ප්‍රයෝජනය සඳහා වාහන ආනයනය කිරීම සඳහා ස්ථිර වශයෙන් ම පහත පෙනෙන ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස්කර එවනු ලබන අයදුම් පත් සළකා බලනු ලැබේ.

2. මෙම දැන්වීම යටතේ එවනු ලබන ඉල්ලුම් පත්, පිටපත් දෙකකින් යුක්තව, 1965 දෙසැම්බර් 4 වැනි සෙනසුරාදා හෝ ඊට පෙර මෙම පාලනයේ " සී " අංශයට ලැබෙන ලෙස ලේඛනගත තැපැලෙන් එවිය යුතුයි. මෙම දැන්වීමේ සියළුම විධිවිධාන වලට අනුකූල නොවන්නා වූ හෝ නියමිත දිනට පසුව ලැබෙන්නාවූ ද කිසිම ඉල්ලුම්පතක් කිසිම ලෙසකින්වත් සලකා බලනු නොලැබේ.

3. ඉල්ලුම්කරුවන් විසින් ඔවුන්ගේ ඉල්ලුම් පත් සමග ලිපි ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි. උදා.—ලියාපදිංචි සහතිකය, වෙළඳ ගිණුම් යනාදිය.

ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන,
ආනයන හා අපනයන පාලක.

1965 නොවැම්බර් මස 19 දින,
කොළඹ දී ය.

### ඉල්ලුම් පත්‍රය

(පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි)

1. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය:————
2. කාණ්ඩ අක්ෂරය (පහත " අ " සටහන බලන්න).
3. දැනට ඇති වාහන පිළිබඳ විස්තර:————

    (දැනට ඇති වාහන ගණන, සම්පූර්ණ විස්තර සහිතව ; ලියාපදිංචි කළ අංකය, වයස ; අවුරුදු සහ මාසවලින්, ධාවනය කරන ලද මුළු සැතැපුම් ගණන ආදිය).

4. අවශ්‍යතාවයන් පිළිබඳ සාරාංශය :—
    - (අ) වාහන පිළිබඳ විස්තර සමග අවශ්‍ය මුලු වාහන ගණන:————
    - (ආ) මුළු සී. ඊ. නැ. ගා. වටිනාකම:————
    - (ඇ) (i) පරණ වාහන වෙනුවට අවශ්‍ය වාහන ගණන:————
        (ii) කැමැති වාහනවල වර්ග : වඩා කැමැති වර්ගය මුලින් සිටිනසේ:————
    - (ඈ) (i) දැනට ඇති වාහනවලට අමතරව අවශ්‍ය වාහන ගණන:————
        (ii) කැමති වාහන වල වර්ග : වඩා කැමති වර්ගය මුලින් සිටිනසේ:————

5. මෙම ඉල්ලුම් පත පරණ වාහන වෙනුවට වාහන ගෙන්වීමට නම් :—
    - (අ) එම පරණ වාහන වල විස්තර, වයස ; අවුරුදු හා මාස වලින්, ධාවනය කරන ලද මුළු සැතැපුම් ගණන හා වාහනවල ලියාපදිංචි කළ අංක :————.
    - (ආ) ඉල්ලුම් පත්‍රය වෙනුවෙන් සම්පූර්ණ හේතුන්:————

6. ඉල්ලුම් පත අතිරේක වාහන ආනයනයට නම් :—

    එනම් දැනට ඇති වාහන වලට අමතරව නම්—
    - (අ) ඉල්ලුම් පත්‍රය වෙනුවෙන් සම්පූර්ණ හේතුන්:————
    - (ආ) 1966 වර්ෂය තුළ අවශ්‍ය අඩුම වාහන ගණන:————
        අවශ්‍ය කුමන ආකාරයේ වාහන ද යන්න සමග:————
    - (ඇ) මේ වෙනුවට දැනට ඇති ප්‍රවාහන පහසුකම්:————

11–1011.


1625——ආර් 10445—8,875 (65/11)

7. අවශ්‍ය එක් එක් වාහනය පිළිබඳ විස්තර :—
(අ) අවශ්‍ය වාහනයේ ආකාරය (එනම්.—ලොරි, වෑන්, ලෑන්ඩ් රෝවර්, ජීප් හෝ මෝටර් බයිසිකල්—පහත " ඇ " සටහන බලන්න).
(ආ) වර්ගය, තාර බර ආදිය :————
(ඇ) ප්‍රාදේශීය නියෝජිතයාගේ නම සහ ලිපිනය :————
(ඈ) පි. ර. නැ. ගා. වටිනාකම (පහත " ආ " සටහන බලන්න).
(ඉ) සම්භවය වූ රට (මේ වෙනුවට යැපිය හැකි වෙනත් රටවල් ද සඳහන් කිරීම මැනවි).

8. ව්‍යාපාරයේ ස්වභාවය සම්බන්ධ විස්තර :—
(අ) තේ, රබර් හෝ පොල් වතු සම්බන්ධව නම් පහත සඳහන් විස්තර සපයන්න:
(i) පිහිටීම :————
(ii) විශාලත්වය :————
(iii) තේ, රබර් හෝ පොල් වගාවන් ඇති අක්කර ගණන, දැනට වගාකරමින් ඇති අක්කර ගණනත් ද සඳහන් කළ යුතුයි.
(iv) වාර්ෂික පළදාව (1964) :————
(v) අළුතින් වගාකිරීමට ඇති අක්කර ගණන :————
(vi) වෙනත් අවශ්‍ය විස්තර ඇතොත් ඒවා :————
(ආ) නිෂ්පාදන කර්මාන්තායතන නම් පහත සඳහන් විස්තර සපයන්න:
(i) කර්මාන්තයේ ස්වභාවය හා සංවර්ධන අධ්‍යක්ෂකගේ අංකය ආදිය ඇතුළත්ව විස්තර :————
(ii) වාර්ෂික නිෂ්පාදනය (1964) :————
(iii) යන්ත්‍රෝපකරණ ආදිය සඳහා යොදා ඇති මූල ධනය :————
(iv) සේවයේ යොදවා ඇති වැඩකරුවන් ගණන :————
(ඇ) අලෙවි කිරීම හා බෙදා හැරීම් සේවය සම්බන්ධයෙන් නම් පහත සඳහන් විස්තර සපයන්න:
(i) ව්‍යාපාරයේ ස්වභාවය :————
(ii) වාර්ෂික ආදායම (1964) :————
(iii) කෙළින්ම සේවයේ යොදවා ඇති සේවකයින් ගණන :————

**සැළකිය යුතුයි.—විස්තර සටහන් :**

(අ) 2 වැනි කොටුවෙහි කාණ්ඩය 'අ', 'ආ' හෝ 'ඇ' කියා යොදන්න.
'අ' කාණ්ඩය—තේ, රබර් හෝ පොල් වතු.
'ආ' කාණ්ඩය—නිෂ්පාදන කර්මාන්ත.
'ඇ' කාණ්ඩය—අලෙවි කිරීම් හා බෙදාහැරීම් සේවය, සමුපකාර සංගම් ද ඇතුළුව.
(ආ) ලොරි සහ වෑන් වෙනුවෙන් ඇන්වීම් සටිකරන ලද වැයියේ පි. ර. නැ. ගා. වටිනාකම සඳහන් කරන්න.
(ඇ) **මෝටර් බයිසිකල් සඳහා තේ, රබර් සහ පොල් වතුවලින් හැර වෙන කාණ්ඩවලින් ලැබෙන ඉල්ලුම් පත් සළකා බලනු නො ලැබේ.**

ඉහතින් සඳහන් විස්තර හැම ආකාරයකින්ම සත්‍ය බවටත් නිවැරදි බවටත් මම/අපි සහතික කරමි/කරමු.

————
ව්‍යාපාරයේ අයිතිකරු/අධ්‍යක්ෂ.

ලිපිනය :————
දිනය :————

11–1011

---

## රේගු නිවේදනය අංක 61/9 208

ආදායම් රක්ෂණ ආඥාපනත (250 වෙනි අධිකාරය) යටතේ අංක 12.781 හා 1961 නොවැම්බර් මස 24 වැනි දින ද ාන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1962 මාර්තු 14 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද ආඥාව අනුව, 1965 නොවැම්බර් මස 22 වෙනි සඳු දින න් ආරම්භ වන සතිය සඳහා නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් රාත්තලක තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම හා ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරු ගාස්තු පහත දක්වේ.

**මේ තීරු ගාස්තුව රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි :—**

| රබර් | රු. ශ. |
|---|---|
| **නොම්මර එකේ ආර්. එස්. එස්. රබර් සඳහා තක්සේරු කරන ලද එෆ්. ඕ. බී. වටිනාකම—රාත්තලකට** ... ... ... | 1 05 |
| **ඕනෑම වර්ගයක රබර් සඳහා අපනයන තීරුව—රාත්තලකට** ... ... ... ... ... | 0 07 |

අංක ර්. 781.
1965 නොවැම්බර් මස 20 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

සී. නාරායනසාමි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

11–1028

---

## රේගු දැන්වීම අංක 64/5/68

1964 අගෝස්තු මස 8 වෙනි දින අංක 14.138 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදුව, 1964.10.16 වැනි දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරගත්. 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ පනතේ 2 වන ඡේදය යටතේ පැනෙන ආඥාව ක්‍රියාත්මක කිරීම සඳහා. 1965 නොවැම්බර් මස 22 වෙනි සඳු දිනෙන් ආරම්භ වන සතිය සඳහා ලන්ඩන් වෙළඳ පොළෙහි පිලිප්පයින් කොප්පරාවල තක්සේරු කරනු ලැබූ රක්ෂණ හා වාහන ගාස්තු ඇතුළත් වටිනාකම ටොන් එකක් අමෙරිකානු ඩොලර් 219 වන බව මෙයින් නිවේදනය කරනු ලැබේ

2. **කොප්පරා, පොල්තෙල්, කපාපු පොල් හා ගෙඩි පොල් සඳහා ගෙවිය යුතු අපනයන තීරු ගාස්තු මෙහි පහත පෙනෙන පරිදි වේ :—**

| කොප්පරා ටොන් එකක් සඳහා අපනයන තීරුව | පොල්තෙල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | කපාපු පොල් ටොන් එකක් සඳහා අපනයන තීරුව | ලෙලි පොල් ගෙඩි 1,000ක් සඳහා අපනයන තීරුව |
|---|---|---|---|
| රු. ශ. | රු. ශ. | රු. ශ | රු. ශ. |
| 295 22 ... | 292 86 ... | 248 70 ... | 73 80 |

3. මෙම තීරු ගාස්තු රේගු ආඥාපනත හැර අන්කිසි ලිඛිත නීතියක් යටතේ ගෙවිය යුතු තීරු ගාස්තුවලට අතිරේක වශයෙනි.

අංක ර් 744/22,
1965 නොවැම්බර් මස 20 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දීය.

සී නාරායනසාමි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

11 1029

ලංකාවේ වැලිවේරියෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රපිතයි